සියලු ම හිමිකම් ඇව්රිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

## වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2014
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

සැලකිය යුතුයි:
(i) පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
(ii) පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10ක් ද බැගින් හිමි වේ.

---

(01) (i) කර්ම ප්‍රභේදයන්ට අනුව පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන බරපතල කුශලාකුශල කර්ම හඳුන්වන නම කුමක් ද?

(ii) අභිභූ රහතන් වහන්සේ සහස්‍රී ලෝක ධාතුවට ඇසෙන සේ ගාථා සජ්ඣායනය කළ බව සඳහන් වන සූත්‍රයේ නම ලියන්න.

(iii) අනුරාධපුර යුගයේ දී ලියා දැනට අපට ඉතිරිව තිබෙන පද්‍ය කෘතියේ නම ලියන්න.

(iv) ශ්‍රී ලංකා ද්වීපයෙන් මියන්මාර දේශයට ත්‍රිපිටක ධර්මය ගෙන යන ලද්දේ යැයි සඳහන් වන්නේ කිනම් රජු දවසේ ද?

(v) දේවානම්පියතිස්ස රජතුමා සෑදූ ථූපාරාම සෑරදුන්ගේ ආරක්ෂාව සඳහා ඉදිකළ ගෘහය හඳුන්වන නම ලියන්න.

(vi) සප්ත ආර්ය ධනයට අයත් දහම් කරුණුවලින් දෙකක් නම් කරන්න.

(vii) ස්ථූපයක සතර පැත්තේ දැකිය හැකි අලංකාර කැටයම් සහිත තොරණක් ආකාරයක ඉදි කළ කලාත්මක නිර්මාණය හඳුන්වන නම ලියන්න.

(viii) පුද්ගලයෙකු විසින් ධාර්මිකව උපයා සපයා ගන්නා ධනය ආරක්ෂා කර ගැනීමට හේතුවන දහම් කරුණු දෙක ලියන්න.

(ix) දස කුශලවලට අයත් කයෙන් සිදු කළ හැකි කුශල කර්ම දෙකක් ලියන්න.

(x) "ඔබට සැක ඇතිවීම ඉතා සුදුසු ය. ඔබට සැක ඇතිවී තිබෙන්නේ සැක ඇති කරගත යුතු කරුණක් පිළිබඳවම ය." බුදුන් වහන්සේ මෙම ප්‍රකාශය කළේ කාට ද?

(02) (i) කලාකරුවා බුදු පිළිම නිර්මාණය කිරීමේ දී භාවිත කළ මුද්‍රා වර්ග දෙකක නම් ලියන්න.

(ii) ස්ථූප ගොඩනැගීමේ දී භාවිත කළ සය ආකාර වූ ආකෘතිවලින් තුනක නම් ලියන්න.

(iii) බුදු දහමින් ඔප් නැංවූ කලාශිල්ප අතර චෛත්‍යයට සුවිශේෂී තැනක් හිමි වේ. චෛත්‍ය නිර්මාණ ඇසුරින් ගොඩනැගුණු බාහිර කලාංග පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

(03) (i) චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කර ගැනීමට පූර්වාංග වන මාර්ග අංගයේ නම ලියන්න.

(ii) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයේ ඇතුළත් වන තෘෂ්ණාවට අයත් ප්‍රභේද තුන හඳුන්වන්න.

(iii) මැදුම් පිළිවෙත අනුගමනය කිරීමෙන් යහපත් ජීවන මාර්ගයක් ගොඩනගා ගත හැකි අයුරු පැහැදිලි කරන්න.

(04) (i) උට්ඨානවතෝ සතිමතෝ.... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථාවේ අදහස ලියන්න.

(iii) මහා පෞරුෂයක් ගොඩනඟා ගැනීමටත් යහපත් ගුණගරුක ජීවිතයක් ගත කිරීමටත් මෙම ගාථාවෙන් ගත හැකි උපදෙස් පැහැදිලි කරන්න.

(05) (i) පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.

(ii) භාරතයේ පැවති ථේරවාද ධර්ම සංගායනා තුනකි. ඒවා පැවැත්වූ ස්ථානවල නම් ලියන්න.

(iii) තෙවන ධර්ම සංගායනාව බුද්ධ ශාසනයේ දිගුකාලීන පැවැත්මට හේතුවූ ආකාරය පැහැදිලි කරන්න.

(06) (i) බුදුරජාණන් වහන්සේ සමීපව ඇසුරු කළ භාරතීය රජවරු දෙදෙනෙකුගේ නම් ලියන්න.

(ii) රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් තුනක් නම් කරන්න.

(iii) එක් රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් ඇසුරෙන් දැහැමි රාජ්‍යක් ගොඩනැගෙන ආකාරය පැහැදිලි කරන්න.

(07) (i) වචනයෙන් සිදු කළ හැකි කුසල කර්ම හතර නම් කරන්න.

(ii) ත්‍රිකෝටික පාරිශුද්ධ ශීලය පිළිපදින ආකාර තුන ලියන්න.

(iii) පංචශීල ප්‍රතිපදාව අනුව කටයුතු කිරීමෙන් ඔබ ජීවත්වන සමාජය යහපත් කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.